# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2022/30 - 2017 ජුනි මස 09 වැනි සිකුරාදා - 2017.06.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙම නියෝගය මගින් එම වගන්තිය යටතේ පනවන ලද 2016.11.10 වැනි දිනැති අංක 1992/29 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද උපලේඛනය (II) හි සඳහන් අයිතම අංක 1 (ඇ) පහත උපලේඛනය පරිදි සංශෝධනය කරමි.

මෙම නියෝගය 2017.06.10 දින සිට ක්‍රියාත්මක වේ.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2017 ජුනි මස 07 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| විස්තරය | | නිෂ්පාදන බද්ද |
|---|---|---|
| රජයේ නිලධාරියකු විසින් 2016.07.14 දිනැති වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 හෝ එයට කරන ලද සංශෝධනවලට අනුකූලව නිකුත් කරන ලද බලපත්‍රයක් උපයෝගී කරගෙන දේශීයව නිෂ්පාදනය කරන ලද මෝටර් රථයක් හෝ ආනයනය කරනු ලබන මෝටර් රථයක මිල, රක්ෂණය සහ ගැල් කුලිය ඇතුළත් වටිනාකම (CIF value) | | |
| (i) | ඇමරිකන් එක්සත් ජනපද ඩොලර් 25,000/- ට නොවැඩි | ගෙවිය යුතු බදු ප්‍රමාණයෙන් 35% |
| (ii) | ඇමරිකන් එක්සත් ජනපද ඩොලර් 25,000/- ට වැඩි නමුත් ඇමරිකන් එක්සත් ජනපද ඩොලර් 30,000/- ට නොවැඩි | ගෙවිය යුතු බදු ප්‍රමාණයෙන් 40% |

06 - 879


1A - PG 3559 — 557 (2017/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*